**ජාතික ආරක්ෂක අරමුදල - 2025**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ආරක්ෂක අරමුදෙලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත සහ 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත් මගින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත. | 2017 ඔක්තෝබර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ජාතික ආරක්ෂක අරමුදල, ආදායම් බද්දෙන් නිදහස් කිරීමට ප්‍රතිපාදන නොමැති බව දන්වා තිබුණද, දාළ පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් බදු කාර්යයන් සඳහා ලියාපදිංචි වීම හා අවශ්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය. | පාලක මණ්ඩල රැස්වීම සඳහා බදු ලියාපදිංචි වීම සබැඳිව පාලක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කල අතර, ඒ සඳහා අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව බදු කාර්ය සඳහා අනුගත වීමට කටයුතු කරනු ලබන බව. | දේශීය ආදායම් පනත අනුව ආදායම් බදු කාර්යයන් සඳහා ලියාපදිංචි වීම හා වාර්තා ඉදිරිපත් කිරීම සිදු කල යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.22,160,023 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.69,946,544 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.92,106,567 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙත්සෙවන නිවාස සඳහා ප්‍රතිලාභ ගෙවීම් රු.110,442,509 කින් හෙවත් සියයට 20.16 කින් අඩු වීම බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව, තම රාජකාරි ඉටු කරන අතරතුර තුවාල ලද හෝ මිය ගිය පොලිස් බලකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයකුගේ පවුල්වලට යම් ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට වඩාත්ම හේතු වන්නේයැයි මණ්ඩලය අදහස් කරන ආකාරයට හා කාර්යයන්ට අරමුදලට අයත් මුදල් යොදා ගැනීමට හැකියාව පැවතියද, ක්‍රියාන්විත රාජකාරි වලදී මියගිය හෝ ආබාධිත රණවිරුවන්ගේ අර්ධ වශයෙන් ඉදිකළ නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා ආධාර මුදල් පිරිනැමීම හැර, ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම හා සහතික කිරීම සඳහා අරමුදලේ අරමුණු සමඟ ඍජුව සම්බන්ධ වන වෙනත් සුදුසු වැඩසටහන් හඳුනාගෙන සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් සමාලෝචිත වර්ෂයේදීද යොමු කර නොතිබුණි. | රාජකාරි ඉටු කරන අතරතුර තුවාල ලැබූ හෝ මියගිය සන්නද්ධ හමුදාවල සාමාජිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල ප්‍රතිලාභීන් හට අරමුදල මගින් ක්‍රියාත්මක මෙත්සෙවණ අර්ධ නිවාස ව්‍යාපෘතිය හා විරුසිසු ප්‍රදීප ශිෂ්‍යත්ව ලබාදීමේ ව්‍යාපෘතිය මගින් පහසුකම් ලබාදීම තුලින් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමෙන් හා රණවිරු දූ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීමට දායක වීම තුලින් ඔවුන්ගේ මානසිකත්වය ඉහළ නැංවීමක් සිදු වේ. එමගින් ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම හා සහතික කිරීමට වක්‍රාකාරව දායක වන බව. | 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තියේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ජාතික ආරක්ෂාව ප්‍රවර්ධන කිරීම හා සහතික කිරීමට ඍජුව දායකවන සුදුසු වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාලක මණ්ඩලය 2023 නොවැම්බර් 17 දින අවසන්වරට රැස්වී තිබුණු අතර ඉන් අනතුරුව 2024 සහ 2025 වර්ෂ තුළ හෝ 2026 මාර්තු 31 දින දක්වා රැස්වූ බවට වාර්තාගත සාක්ෂි නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම පාලක මණ්ඩලයේ පූර්ව අනුමැතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් ඉදිරිපත් කිරීමට නොහැකිව තිබූ බව නිරීක්ෂණය විය. | ජාතික ආරක්ෂක අරමුදලේ පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙස ජනාධිපති විසින් පත්කරන නියෝජිතයා ලෙස මහාචාර්ය අත්තංගනේ රතනපාල ස්වාමීන් වහන්සේ පත් කිරීමෙන් පසු 15 වන පාලක මණ්ඩලය 2026 අප්‍රේල් 18 වන දින රැස්වන ලදී. එහිදී පාලක මණ්ඩල පත්‍රිකාවන් ලෙස ඉදිරිපත් කරන ලද 2025 වර්ෂයට අදාල අයවැය ලේඛනය, ක්‍රියාකාරී සැලැස්ම සහ මූල්‍ය ප්‍රකාශන, කාර්යසාධන වාර්තාව සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලද බව. | පාලක මණ්ඩලය රැස්වී නියමිත කාලය ඉක්මවීමට පෙර අයවැය හා ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මෙත්සෙවණ ව්‍යාපෘතිය යටතේ 2025 වර්ෂයේදී රණවිරුවන්ගේ අර්ධ වශයෙන් ඉදිකළ නිවාස 50 ක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීමට සැලසුම් කර තිබූ අතර, යුධ හමුදාව, නාවික හමුදාව සහ පොලීසියේ ප්‍රතිලාභීන් 32 ක් ගෙවීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව, තෝරාගත් ප්‍රතිලාභීන් 32 දෙනා සඳහා රු.මිලියන 28.17 ක ආධාර මුදල් වාරික 3 ක් යටතේ වර්ෂය තුළ ගෙවා අවසන් කිරීමට සැලසුම් කර තිබුනද, 2025 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රතිලාභීන් 25 දෙනෙකු වෙත පළමු වාරිකය ලෙස රු.මිලියන 7.5 ක් පමණක් ගෙවා තිබුණි. ඒ අනුව, ගෙවීමට සැලසුම් කළ මුදලින් සියයට 73 ක් හෙවත් රු.මිලියන 20.67 ක මුදලක් ගෙවීමට පැවති අතර, සැලසුම් කළ පරිදි ප්‍රතිලාභ ගෙවීම් සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රගතිය අත්කරගෙන නොතිබුණි. | මෙත් සෙවණ අර්ධ නිවාස ව්‍යාපෘතියට අදාලව සලකා බලන ගිණුම් වර්ෂයේ නිම කිරීමට අපේක්ෂිත කොටස එම වර්ෂයේම නිම කිරීමට සහ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කර කඩිනමින් නිමකිරීමට ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ත්‍රිවිධ හමුදාවට හා පොලීසියට අදාල සුබසාධක අංශ සහ ව්‍යාපෘතියට අදාල දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර, ව්‍යාපෘතිය ප්‍රමාද වීම සඳහා කලින් කලට බලපානු ලබන හේතු පිළිබඳව අවධානය යොමු කරමින් සුබසාධක අංශ සමග සම්බන්ධතාවයෙන් ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතියේ ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභ කඩිනමින් ලබා දීමටත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අඛන්ඩව අධීක්ෂණය කර නියමිත කාල සීමාව තුල සම්පූර්ණ කිරීමටත්, ප්‍රගති සමාලෝචනයන් සිදුකර හදුනාගත් බාධක සඳහා කඩිනම් විසදුම් ලබා දීමටත් කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ **සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වුවත් අරමුදලේ 2017 සිට 2024 දක්වා වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික ආරක්ෂක අරමුදලේ 2017 වර්ෂයේ සිට 2024 දක්වා මූල්‍ය කාර්යසාධන වාර්තා සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින බව | 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුව වෙත නියමිත කාලසීමාව තුල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |